සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

සක්‍යා උසස් අධ්‍යාපන ආයතනය සක්‍යා උසස් අධ්‍යාපන ආයතනය Sakya Academy of Higher Education Sakya Academy of Higher Education

සක්‍යා උසස් අධ්‍යාපන ආයතනය
Sakya Academy of Higher Education

SAP EXAMINATION

# සක්‍යා උසස් පෙළ පෙරහුරු විභාගය 2022
# Sakya Advanced Level Preparatory Examination 2022

**Final 1**

| | | |
|---|---|---|
| ව්‍යාපාර අධ්‍යයනය I<br>Business Studies I | 32 S I | *පැය එකයි*<br>*One Hour* |

**උපදෙස්:**
- **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ ම** සපයන්න.
- **විභාග අංකය**, ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
- ප්‍රශ්න අංක **1** සිට **25** තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති තිත් ඉරි මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකටම ලකුණු **දෙක** බැගින් හිමි වේ.

විභාග අංකය ........................................................

පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.

| I පත්‍රය සඳහා | |
|---|---|
| ප්‍රශ්න අංක | ලකුණු |
| 01 - 25 | |
| එකතුව | |
| | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අති. ප්‍රධාන පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |

- **ප්‍රශ්න අංක 1 සිට 15 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි හෝ ඉතාමත් ම ගැළපෙන හෝ පිළිතුර තෝරාගෙන, එය උත්තර පත්‍රයේ උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

01. කිරිපිටි පෝලිම්, ගෑස් පෝලිම් මේ දිනවල මෙරට තුළ සුලභව දැකිය හැකි දසුනකි. එවැනි පෝලිමක පැය කිහිපයක් සිට ගෑස් සිලින්ඩරයක් නිවසට ගෙන එන ලදි. ගෑස් මිල දී ගැනීම සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වනුයේ,
    (1) ආහාර නැමති අවශ්‍යතාව ඉටුකර ගැනීමකි
    (2) බලශක්තිය නැමති වුවමනාව ඉටුකර ගැනීමකි
    (3) කාර්මික භාණ්ඩයක් මිල දී ගැනීමකි
    (4) නොසෙ වූ භාණ්ඩයක් මිල දී ගැනීමකි
    (5) පාරිභෝගික භාණ්ඩයක් මිල දී ගැනීමකි

- පහත දැක්වෙන සිද්ධිය කියවා 02 හා 03 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

02. භූ විද්‍යා හා පතල් කාර්යාංශයෙන් **නිසි පරිදි බලපත්‍ර ලබා ගත්** මැණික් පතල් හිමියෙකු වූ පල්ලම්සේන තම **පතලෙන් උකහා ගත් මැණික්** කහවත්තට ගෙන ගොස් **නවීන යන්ත්‍රානුසාරයෙන්** ඔප මට්ටම් කර තරුණ තරුණියන් සඳහා නව විලාසිතාවන්ගෙන් යුත් ස්වර්ණාභරණ නිෂ්පාදනය කර අලෙවි කිරීමෙන් **ඉහළ ලාභයක් උපයයි.**
    ඉහත තද කළු අකුරෙන් දැක්වෙන කරුණුවලින් ප්‍රකාශවන සාර්ව පරිසර සාධක අනුපිළිවෙළින් ඇතුළත් නිවැරදි පිළිතුර වන්නේ,
    (1) නෛතික පරිසරය / ස්වාභාවික පරිසරය / තාක්‍ෂණික පරිසරය / ආර්ථික පරිසරය
    (2) දේශපාලන පරිසරය / ස්වාභාවික පරිසරය / ගෝලීය පරිසරය / ප්‍රජා පරිසරය
    (3) නෛතික පරිසරය / තාක්‍ෂණික පරිසරය / ගෝලීය පරිසරය / ආර්ථික පරිසරය
    (4) නෛතික පරිසරය / ස්වාභාවික පරිසරය / තාක්‍ෂණික පරිසරය / ප්‍රජා පරිසරය
    (5) දේශපාලන පරිසරය / ආර්ථික පරිසරය / තාක්‍ෂණික පරිසරය / ප්‍රජා පරිසරය

03. මෙහි සඳහන් මැණික් පතල, ස්වර්ණාභරණ නිෂ්පාදනය සහ අලෙවි කිරීම යන ව්‍යාපාර පිළිවෙළින් අයත් වන පිළිතුර තෝරන්න.
    (1) ප්‍රාථමික නිෂ්පාදන ව්‍යාපාර, සේවා නිෂ්පාදන ව්‍යාපාර, ද්විතීයික නිෂ්පාදන ව්‍යාපාර
    (2) කෘෂිකාර්මික නිෂ්පාදන ව්‍යාපාර, සේවා නිෂ්පාදන ව්‍යාපාර, කාර්මික නිෂ්පාදන ව්‍යාපාර
    (3) ප්‍රාථමික නිෂ්පාදන ව්‍යාපාර, ද්විතීයික නිෂ්පාදන ව්‍යාපාර, තෘතියික නිෂ්පාදන ව්‍යාපාර
    (4) සුළු පරිමාණ නිෂ්පාදන ව්‍යාපාර, මධ්‍ය පරිමාණ නිෂ්පාදන ව්‍යාපාර, මහා පරිමාණ නිෂ්පාදන ව්‍යාපාර
    (5) කාර්මික නිෂ්පාදන ව්‍යාපාර, ද්විතියික නිෂ්පාදන ව්‍යාපාර, සේවා නිෂ්පාදන ව්‍යාපාර

[ දෙවෙනි පිටුව බලන්න

04. පහත දක්වෙන්නේ ආර්ථික තිරසර සංවර්ධනය හා සමාජ තිරසර සංවර්ධනය සඳහා ව්‍යාපාරවලට ගත හැකි ක්‍රියාමාර්ග කිහිපයකි.

A - සම්පත් කාර්යක්ෂම භාවිතය
B - මානව අයිතිවාසිකම් සුරැකීමට දායක වීම
C - රැකියා නිර්මාණය
D - අත්‍යාවශ්‍ය සේවා සඳහා දායක වීම
E - අවදානම් කළමනාකරණය
F - නීතිය හා සාමය සුරැකීමට දායක වීම

ඉහත ක්‍රියාමාර්ග අතුරෙන් සමාජ තිරසර සංවර්ධනයට අදාළ ක්‍රියාමාර්ග පමණක් ඇතුළත් කාණ්ඩය තෝරන්න.

(1) C,D,E (2) B,D,E (3) A,C,E
(4) B,D,F (5) D,E,F

05. "ව්‍යාපාරයකට තම අයිතිකරුවන් කෙරෙහි මෙන් ම ව්‍යාපාරය ක්‍රියාත්මක වන හා පෝෂණය වන බාහිර සමාජය කෙරෙහි යුතුකමක් ඇති බව" ප්‍රකාශ කෙරෙනුයේ,

(1) ව්‍යාපාර ආචාර ධර්ම තුළිනි
(2) ව්‍යාපාර ආචාර ධර්ම සංග්‍රහයක් තුළිනි
(3) ව්‍යාපාර සමාජ වගකීම තුළිනි
(4) ව්‍යාපාරයක සමාජය කෙරෙහි ඇති සමාජ වගකීම තුළිනි
(5) ව්‍යාපාරයක සදාචාරාත්මක වගකීම තුළිනි

06. ''2023 වර්ෂය සඳහා රාජ්‍ය අයවැය ලේඛනය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට පෙර මුදල් ඇමතිවරයා ප්‍රකාශ කළේ පසුගිය වර්ෂයට වඩා 10% කින් ප්‍රාග්ධන වියදම් සඳහා මුදල් ප්‍රතිපාදනය කර ඇති බවයි.''
මුදල් ඇමතිවරයාගේ ප්‍රකාශයේ සඳහන් ප්‍රාග්ධන වියදම් පමණක් ඇතුළත් වියදම් කාණ්ඩය වන්නේ,

(1) මහා මාර්ග තැනීම, වැටුප් හා වේතන ගෙවීම්, පොලී ගෙවීම්, මත්තල ගුවන් තොටුපල ඉදිකිරීම
(2) මහා මාර්ග ඉදිකිරීම, පොලී ගෙවීම්, පාලම් ඉදිකිරීම, වරාය ඉදිකිරීම
(3) වැටුප් හා වේතන ගෙවීම්, පොලී ගෙවීම්, ආරක්ෂක වියදම්, වරාය ඉදිකිරීම
(4) වැටුප් හා වේතන ගෙවීම්, පොලී ගෙවීම්, ආරක්ෂක වියදම්, ගුවන් තොටුපල ඉදිකිරීම
(5) අධිවේගී මාර්ග ඉදිකිරීම, පාලම් තැනීම, වරායේ බටහිර ජැටිය ඉදිකිරීම, ගුවන් තොටුපල ඉදිකිරීම

07. පහත දක්වෙන්නේ සංස්ථාපිත සමාගම්වලට අදාළ ලක්ෂණ කිහිපයකි.

A - කොටස් ප්‍රසිද්ධියේ නිකුත් කළ හැකි වීම
B - උපරිම කොටස්කරුවන් සංඛ්‍යාව 50 කි
C - කොටස් හා ණයකර නිකුත් කර ප්‍රාග්ධනය සපයා ගත හැකි වීම
D - අවම අධ්‍යක්ෂවරු සංඛ්‍යාව 01 කි
E - කොටස්කරුවන්ට ලාභාංශ ගෙවීමට පෙර ණය ගෙවීමේ හැකියාව පිළිබඳ පරීක්ෂණයක් කළ යුතු වීම

සීමිත පොදු සමාගම් හා පෞද්ගලික සමාගම්වලට අදාළ ව ලක්ෂණ නිවැරදිව ගළපා ඇති පිළිතුර තෝරන්න.

| | පොදු සමාගම්වල ලක්ෂණ | පෞද්ගලික සමාගම්වල ලක්ෂණ |
|---|---|---|
| (1) | A, C හා E | B, C හා D |
| (2) | A, B හා C | B, D හා E |
| (3) | A, B හා D | C, D හා E |
| (4) | B, C හා D | A, D හා E |
| (5) | B, D හා E | A, B හා C |

08. පහත වගුවේ ව්‍යවසායකත්ව ප්‍රවණතා සහ ඒවාට අදාළ සිද්ධීන් කිහිපයක් දක්වා ඇත.

| ව්‍යවසායකත්ව ප්‍රවණතාව | සිද්ධිය |
|---|---|
| (i) ගෝලීය ව්‍යවසායකත්වය | A - කොළඹ තරුණ බෞද්ධ සංගමය විශේෂ අවශ්‍යතා ඇති ළමුන්ට ඉගෙනුම් මධ්‍යස්ථාන අරඹයි |
| (ii) හරිත ව්‍යවසායකත්වය | B - බොබිටෙල් දුරකථන සමාගමේ තාක්ෂණික ශිල්පියෙකු නවීන පහසුකම් සහිත දුරකථනයක් නිර්මාණය කර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කරයි |
| (iii) අභ්‍යන්තර ව්‍යවසායකත්වය | C - සීකොම් දුරකථන සමාගම බෙල්කොම් දුරකථන සමාගම හා ඒකාබද්ධව නවතම කථන පහසුකම්වලින් සමන්විත අන්තර්ජාල සේවා සපයයි |
| (iv) සමාජ ව්‍යවසායකත්වය | D - රන්පත් සමාගම කඩදාසි රහිත කාර්යාල ක්‍රමයක් හඳුන්වා දෙයි |

ඉහත දී ඇති ව්‍යවසායකත්ව ප්‍රවණතා අනුපිළිවෙළ අනුව සිද්ධීන් නිවැරදිව ගළපා ඇති වරණය කුමක් ද ?

(1) C,B,A,D (2) C,A,D,B (3) C,D,B,A
(4) C,B,D,A (5) C,D,A,B

09. සුළු ව්‍යාපාරයක් පවත්වා ගෙන යන යොහානි තම මිතුරිය වූ ලිතුලිට ට තමන්ගේ ව්‍යාපාරයේ සාර්ථකත්වයට හේතු වූ සාධක ලෙස නිෂ්පාදිත දිවයින පුරා අලෙවි වීම (...........) ද, අවශ්‍ය වේලාවට මුදල් ලැබීම (...........) ද, එසේ ම අසාර්ථකත්වයට හේතු වූ සාධක ලෙස අවශ්‍ය කාර්ය කරගෙන යාමට මූලික පහසුකම් ප්‍රමාණවත් නොවීම (...........) ද, තමන්ගේම පාලන අඩුලුහුඬුකම් පැවතීම (............) ද ප්‍රකාශ කර සිටින්නී ය.
ඉහත ප්‍රකාශයට අනුව යොහානි ගේ ව්‍යාපාරයේ සාර්ථකත්වයට හා අසාර්ථකත්වයට හේතු වූ කරුණු සඳහා හිස්තැන් පිරවීමට සුදුසු නිවැරදි පාරිභාෂිතයන් අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුරු කාණ්ඩය තෝරන්න.

(1) අලෙවි පහසුකම් පැවතීම / ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් නොවීම / තාක්ෂණික සේවා පහසුකම් ප්‍රමාණවත් නොවීම හා කළමනාකරණ දුර්වලතා
(2) පැතුරුණු වෙළඳ පොළක් පැවතීම / ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් පැවතීම / යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම හා කළමනාකරණ දුර්වලතා
(3) අලෙවි පහසුකම් පැවතීම / බදු සහන ලබා දීම / කළමනාකරණ දුර්වලතා හා යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම
(4) අලෙවි පහසුකම් පැවතීම / ප්‍රමාණවත් මූල්‍ය පහසුකම් පැවතීම / තාක්ෂණික සේවා පහසුකම් ප්‍රමාණවත් නොවීම හා කළමනාකරණ දුර්වලතා
(5) පැතුරුණු වෙළඳ පොළක් පැවතීම / බදු සහන ලබා දීම / යටිතල පහසුකම් ප්‍රමාණවත් නොවීම හා කළමනාකරණ දුර්වලතා

10. පහත දැක්වෙන්නේ ණය පතකට සෘජු ව මෙන් ම වක්‍රව විවිධ ආකාරයෙන් සම්බන්ධ පාර්ශ්ව වේ.
A - කාඩ්පත් හිමියා
B - ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය
C - වෙළෙන්දා
D - ණයපත් සංගමය
E - ගිණුම් හිමියා
F - කාඩ්පත් නිකුත් කරන ආයතනය
G - ණය තොරතුරු කාර්යාංශය

ණය පතකට සෘජුව සම්බන්ධ පාර්ශ්ව පෙළ ගැසූ විට නිවැරදි පිළිතුර වන්නේ මින් කුමක් ද ?

(1) A,C,D,E (2) B,C,D,E (3) C,D,F,G
(4) A,C,D,F (5) A,D,F,G

11. පහත දැක්වෙන්නේ රක්ෂණය කළ හැකි හා රක්ෂණය කළ නොහැකි අවදානම්වලට උදාහරණ කිහිපයකි. ඒ අතුරින් රක්ෂණය කළ හැකි අවදානම් පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.
A - වාහනයක අගය වාර්ෂික ව ක්ෂය වීම
B - ව්‍යාපාරයේ කළමනාකරුවන්ගේ තීරණයක් මත අලාභ ලැබීම
C - කල්බදු ක්‍රමයට ලබාගත් වාහනයක් අනතුරකට පත්වීමෙන් වන හානි
D - ණයගැතියෙකුගෙන් ලැබිය යුතු මුදල් නොලැබී යාම
E - එක් නිෂ්පාදිතයක අලෙවිය අඩුවීමෙන් ඇති වූ පාඩු
F - බැංකුවෙන් මුදල් රැගෙන යාමේ දී සිදු වන පැහැර ගැනීම

(1) A, B, C (2) B, C, D (3) B, C, F
(4) D, E, F (5) C, D, F

[ හතරවැනි පිටුව බලන්න

12. පහත දක්වෙන්නේ විවිධ සන්නිවේදන ක්‍රම මගින් සන්නිවේදනය සිදු කරන ආකාරය දක්වෙන සටහනකි.

| | වාචික | ලිඛිත | සංඥා හා සංකේත |
|---|---|---|---|
| අභ්‍යන්තර | රැස්වීම්<br>සම්මුඛ සාකච්ඡා<br>A | නිවේදන<br>දැන්වීම් පුවරුව<br>B | C<br>සීනුව<br>නලාව |
| බාහිර | ජංගම දුරකථන<br>D<br>ශබ්ද විකාශන යන්ත්‍ර | බැනර්<br>ලිපිය<br>ෆැක්ස් | ඇසුරුම් සංකේත<br>වාහන නලා<br>මාර්ග සංඥා |

ඉහත සටහනේ A, B, C හා D යන ස්ථාන සඳහා වඩාත් නිවැරදි පිළිතුර අනුපිළිවෙළින් ඇතුළත් වරණය තෝරන්න.

(1) මෙමෝ පත්‍ර / මග සලකුණු / දුරකථන / ඉන්ටර්කොම්
(2) මග සලකුණු / මෙමෝ පත්‍ර / ඉන්ටර්කොම් / දුරකථන
(3) දුරකථන / මග සලකුණු / මෙමෝ පත්‍ර / ඉන්ටර්කොම්
(4) ඉන්ටර්කොම් / මග සලකුණු / මෙමෝ පත්‍ර / දුරකථන
(5) ඉන්ටර්කොම් / මෙමෝ පත්‍ර / මග සලකුණු / දුරකථන

13. පහත දක්වා ඇති ප්‍රවාහන හා සැපයුම් සේවා ක්‍රියාවලියට ඇතුළත් පියවර අනුපිළිවෙළින් නිවැරදි ව දක්වා ඇති පිළිතුරු කාණ්ඩය තෝරන්න.

A - පාරිභෝගික අවශ්‍යතා හා වුවමනා සපුරාලීමේ අරමුණ තීරණය කිරීම
B - වෙළෙඳ පොළ පර්යේෂණ අවශ්‍යතා සැලසුම් කිරීම
C - ආරම්භක අවස්ථාවේ සිට පරිභෝජන අවස්ථාව දක්වා පරාසය තීරණය
D - භාණ්ඩ, සේවා හා අදාළ තොරතුරු ඉදිරියට හා පසුපසට ගලායාමට සැලැස්වීම
E - කාර්යක්ෂමව හා සඵලදායීව එම කටයුතු සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම

(1) A, B, D, E (2) B,E,D,C (3) A,C,D,E
(4) C,D,B,E (5) A,D,C,E

14. පාරිභෝගික භාණ්ඩ බෙදාහැරීමේ මාර්ග දෙකකට අදාළ තොරතුරු පහත දක් වේ.

1. නිෂ්පාදකයා → A → සිල්ලර වෙළෙන්දා → B

11. නිෂ්පාදකයා → C → D → සිල්ලර වෙළෙන්දා → පාරිභෝගිකයා

ඉහත දක්වෙන බෙදාහැරීමේ මාර්ග හා සම්බන්ධ හිස්තැන්වලට අදාළ පාර්ශ්වයන් නිවැරදි ව දක්වෙන පිළිතුරු කාණ්ඩය තෝරන්න.

| | A | B | C | D |
|---|---|---|---|---|
| (1) | නියෝජිතයා | තොග වෙළෙන්දා | පාරිභෝගිකයා | සිල්ලර වෙළෙන්දා |
| (2) | තොග වෙළෙන්දා | පාරිභෝගිකයා | නියෝජිතයා | තොග වෙළෙන්දා |
| (3) | තොග වෙළෙන්දා | පාරිභෝගිකයා | නියෝජිතයා | සිල්ලර වෙළෙන්දා |
| (4) | තොග වෙළෙන්දා | නියෝජිතයා | පාරිභෝගිකයා | නිෂ්පාදකයා |
| (5) | නියොජිතයා | පාරිභෝගිකයා | තොග වෙළෙන්දා | නිෂ්පාදකයා |

15. ඉන්දියන් ඕවර්සීස් බැන්ක් හි ගිණුමක් හිමි බජාජ් ඔටෝ ලිමිටඩ් සමාගමෙන් ඩේවිඩ් නැමැත්තා ත්‍රී රෝද රථයක් ආනයනය කිරීමට තීරණය කර ඇත. ඩේවිඩ්ට ලංකා බැංකුවේ ගිණුමක් ඇත. මෙහි දී ණයවර ලිපිය නිකුත් කරනු ලබන්නේ,

(1) ඩේවිඩ් විසින් බජාජ් ඔටෝ ලිමිටඩ් සමාගම වෙත යි
(2) ඩේවිඩ් විසින් ලංකා බැංකු වෙත යි
(3) බජාජ් ඔටෝ ලිමිටඩ් සමාගම විසින් ඩේවිඩ් වෙත යි
(4) ලංකා බැංකුව විසින් ඉන්දියානු ඕවර්සීස් බැන්ක් වෙත යි
(5) බජාජ් ඔටෝ ලිමිටඩ් සමාගම විසින් ලංකා බැංකුව වෙත යි

[ පස්වැනි පිටුව බලන්න

✷ අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

16. (අ) නිෂ්පාදනයේ ස්වභාවය අනුව වර්ග කිරීමේදී පතල් හා කැනීම් කර්මාන්තය ....................... අයත් වුවද කර්මාන්ත මූලය අනුව වර්ග කිරීමේ දී පතල් හා කැනීම් කර්මාන්තය ............................... අයත් වේ.

(ආ) පවතින නිෂ්පාදිත හා නිෂ්පාදන ක්‍රියාවලි පිළිබඳවත්, නව නිෂ්පාදන ක්‍රම පිළිබඳවත් විද්‍යාත්මක තොරතුරු ඒකරාශී කිරීම හා වැඩි දියුණු කිරීම ....................................................................................... ලෙස හඳුන්වන අතර ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා හා වුවමනා හඳුනා ගෙන ඒවා තෘප්තිමත් කිරීමට කටයුතු කිරීම ......................................... යන ව්‍යාපාර කාර්යයේ දී සිදු වේ.

17. (අ) කොටස් නිකුත් කිරීම් සම්බන්ධයෙන් සහ කොටස් මත වූ ඇරයුම් සම්බන්ධයෙන් සමාගමට ලැබුණු හෝ ලැබිය යුතු සියලු මුදල්වල එකතුව ......................................... ලෙස හැඳින්වෙන අතර සීමිත පොදු සමාගමක් යම් බෙදාහැරීමක් කිරීමට පෙර ......................................................................... සම්පූර්ණ කළ යුතුය.

(ආ) සීමාසහිත පොදු සමාගමක සාමාන්‍ය කොටස් හිමියෙකුට වාර්ෂික මහ සභා රැස්වීමට සහභාගී වීමට අවකාශය නොමැති විට ඔහු වෙනුවෙන් සහභාගී කරවිය හැකි නියෝජිතයා .................................... වන අතර සමාගමක් මූලික කොටස් නිකුතුවෙන් රැස්කර ගත යුතු අවම මුදල ලෙස අධ්‍යක්ෂ මණ්ඩලය තීරණය කරන ප්‍රමාණය ............................................ ලෙස හඳුන්වයි.

18. (අ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණයට යටත් වුවද මහජනයාගෙන් තැන්පතු භාර ගැනීමට අවසර නොමැති විශේෂිත මූල්‍යායතන දෙකක් ලෙස ..................................................... හා .......................................... හඳුනා ගෙන ඇත.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණයට යටත්, ගිවිසුම්ගත ඉතිරි කිරීමේ ආයතනයක් ලෙස ...................................................... හඳුනාගත හැකි වුවද මහ බැංකුවේ අධීක්ෂණයට යටත් වන හා මහජනයාගෙන් තැන්පතු භාර ගැනීමට හැකි බැංකු අංශයට අයත් නොවන මූල්‍යායතනයක් වන්නේ ................................................ ය.

19. (අ) ණයට විකුණන ලද භාණ්ඩ වෙනුවෙන් මුදල් එකතු කිරීමේ වගකීම භාර ගන්නා නියෝජිතයා හඳුන්වනුයේ ........................................................ ලෙස වන අතර ප්‍රධානියා වෙනුවෙන් තම අභිමතය පරිදි භාණ්ඩ මිලට ගැනීම, විකිණීම සහ ගිවිසුම් ඇතිකර ගැනීම කරන්නා ............................................. වේ.

(ආ) සංවර්ධනය වෙමින් පවතින රටවලට යුරෝපා සංගමයේ රටවලින් ලබා දෙන තීරුබදු සහනය ....................................................................................... ලෙස ද යුරෝපා සංගමයෙන් ආනයනය කරන ලද භාණ්ඩ රට තුළට නොගෙන වරාය තුළ නැවත සකසා හෝ සැකසීමෙන් තොරව ඉන්දියාවට අපනයන කිරීම ......................................................... ලෙස හඳුන්වයි.

20. (අ) පුද්ගලයෙකුගේ හෝ සංවිධානයක අවශ්‍යතාවක් හෝ වුවමනාවක් ඉටු කළ හැකි නිෂ්පාදිතයක් පිළිබඳව ව්‍යවසායකයකු තුළ පවතින සිතුවිල්ල ............................... වන අතර එය අලෙවි කළ හැකි නම් ........................................... බවට පත් වේ.

(ආ) ව්‍යවසායකයෙකුගේ ප්‍රධාන කාර්යය වන්නේ, ............................................. වන අතර ඒ සඳහා අවශ්‍ය ම ගුණාංගය වනුයේ ............................................. යි.

✷ අංක 21 සිට 25 තෙක් ප්‍රශ්නවලට නිශ්චිත පිළිතුරු සපයන්න.

21. පහත ප්‍රමිතීන්ට අදාළ පද්ධති සහතිකකරණය (ක්ෂේත්‍රය) ලියන්න.

1. ISO 9001 : 2015 - ..........................................................................................
2. FSSC 22000 - ..........................................................................................
3. ISO 45001 : 2018 - ..........................................................................................
4. ISO 50001 : 2011 - ..........................................................................................

**22.** ව්‍යාපාරිකයෙකු තොග ගබඩාවක් ස්ථානගත කිරීමේ දී සැලකිල්ලට ගත යුතු සාධක හතරක් ලියන්න.

1. ..........................................................................................................
2. ..........................................................................................................
3. ..........................................................................................................
4. ..........................................................................................................

**23.** සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ආශ්‍රිතව දැකිය හැකි සීමා හතරක් දක්වන්න.

1. ..........................................................................................................
2. ..........................................................................................................
3. ..........................................................................................................
4. ..........................................................................................................

**24.** වරලත් ගිවිසුම අනුව වරලත්ලාභියා විසින් හිමියාට සැපයිය යුතු දෑ හතරක් සඳහන් කරන්න.

1. ..........................................................................................................
2. ..........................................................................................................
3. ..........................................................................................................
4. ..........................................................................................................

**25.** කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය පාලනය සඳහා භාවිත කෙරෙන පහත සඳහන් එක් එක් සංකේතයේ අදහස ලියන්න.

1.  ..........................................................................................

2.  ..........................................................................................

3.  ..........................................................................................

4.  ..........................................................................................

සැකසුම : බණ්ඩාර දිසානායක.
B.Sc.(Mgt) Sp.